මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක : **PE/2024/11** **2024.10.07**

## පාර්ලිමේන්තු මැතිවරණය - 2024.11.14

## තැපෑලෙන් ඡන්දය ඉල්ලුම් කිරීම

1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 26 වන වගන්තිය අනුව මෙම පාර්ලිමේන්තු මැතිවරණ කාර්යය සඳහා පත් කරනු ලැබූ / පත්කරනු ලැබීමට ඉඩ ඇති සියලුම රාජ්‍ය හා ව්‍යවස්ථාපිත මණ්ඩල නිලධාරීන් / සේවකයන් තැපෑලෙන් ඡන්දය දීම සඳහා ඉල්ලුම් කළ යුතු බව අවධාරණය කරනු ලැබේ.

තැපැල් ඡන්ද ඉල්ලුම් නොකිරීම හෝ යම් යම් අඩුපාඩු මත ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප වීම මැතිවරණ රාජකාරිවලින් නිදහස් කිරීමට හේතුවක් නොවන බව වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

එමෙන්ම සෘජුවම මැතිවරණ හා සම්බන්ධ කාර්යය සඳහා පත්කරනු නොලබන කිසිදු රාජ්‍ය හා ව්‍යවස්ථාපිත මණ්ඩල නිලධාරියෙකු / සේවකයකු තැපැල් ඡන්ද ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම් නොලබන අතර එවැනි නිලධාරීන් / සේවකයන් තැපැල් ඡන්ද ඉල්ලුම් කිරීම සහ එවැනි ඉල්ලුම්පත් සහතික නොකරන ලෙස ආයතන ප්‍රධානීන්ට සහ සහතික කිරීමේ නිලධාරීන්ට දන්වනු ලැබේ. සුදුසුකම් නොලබන තැනැත්තන් තැපැල් ඡන්ද ඉල්ලුම් කිරීම සඳහා පෙළඹවීම නොකළ යුතු ය.

ඉහත උපදෙස් අනුව ක්‍රියා නොකිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 උ උ ව්‍යවස්ථාව අනුව දඩයකට හෝ/ සහ අවුරුදු තුනක් දක්වා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් ලැබිය හැකි වරදක් බව නිවේදනය කරනු ලැබේ.

එබැවින් මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කරන මෙන් අදාළ සියළු පාර්ශ්ව වෙතින් මැතිවරණ කොමිෂන් සභාව ඉල්ලා සිටී.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්